සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I

**12 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

උපදෙස් :- • ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
• එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය වරහන් තුළ දක්වන්න.

---

• **අංක 01 සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට සපයා ඇති ප්‍රකාශ පහ අතරින් හතරක් පමණක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

(01) දේශපාලන විද්‍යාව,

(1) සමාජ විද්‍යාවන් අතරින් පැරණිතම සමාජ විද්‍යාවයි.
(2) උසස්ම සමාජ විද්‍යාව ලෙස සැලකේ.
(3) ස්වභාවික විද්‍යාවන් සමග සමීපයෙන් බැඳී පවතී.
(4) සමාජ විද්‍යාවකි.
(5) විවිධ චින්තන ධාරාවන් ඔස්සේ ඓතිහාසිකව විකාශනය වූ විෂයයකි. (......)

(02) දේශපාලන විද්‍යාව සලකා බලන මූලික කරුණක් නොවන්නේ,

(1) මානවයන්ගේ සාදාචාරාත්මක ජීවිතය ඉහළ නැංවීමයි.
(2) රාජ්‍යයේ ආරම්භය, වර්ධනය හා ස්වභාවයයි.
(3) දේශපාලනයට අදාළ න්‍යායන් නිගමනය කිරීමයි.
(4) යහපත් ආණ්ඩුවක ස්වභාවය හා ආකෘතිය කුමක්ද යන්නයි.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වභාවය කුමක්ද යන්නයි. (......)

(03) දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ අරමුණු වලට අදාළ නොවන්නේ,

(1) දේශපාලන ක්‍රම පිළිබඳ අවධානය පුළුල් කිරීමයි.
(2) විචාරශීලී බව වර්ධනය කරගත හැකි වීමයි.
(3) අන්තර්ජාතික සමාජ පිළිබඳ අවබෝධ කරගත හැකි වීමයි.
(4) රාජ්‍ය තාන්ත්‍රිකයන් බිහි කිරීමයි.
(5) සමාජයේ සංස්කෘතික සාරධර්ම ගැන දැනුම වර්ධනය කිරීමයි. (......)

(04) ජාතික රාජ්‍ය බිහි වීමට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න,

(1) පාප් ආධිරාජ්‍ය බිඳ වැටීම.
(2) වැඩවසම් ක්‍රමය නැගී ඒමේ ප්‍රතිඵලයකි.
(3) කාර්මික විප්ලවයෙහි ප්‍රතිඵලයකි.
(4) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය.
(5) පුනර්ජීවන විප්ලවය. (......)

(05) රාජ්‍ය පිළිබඳ ලිබරල් වාදී න්‍යායට ගැලපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A මිනිසුන් විසින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට පිහිටුවා ගනු ලැබීය.
B මිනිසාගේ භෞතික සංවර්ධන සඳහා කටයුතු කිරීම රාජ්‍යයේ ප්‍රධාන කාර්යය වීම.
C විවිධත්වය සහිත මිනිසුන් පාලනය කිරීමත්, පොදු යහපත සැලසීමටත් රාජ්‍ය පිහිටුවා ගනු ලැබීය.
D රාජ්‍යයේ බලය වැඩිවන තරමට මහජනයාගේ යහපත අධික වේ.
E එය සමාජයේ පවත්නා සුවිශේෂී සමාගමකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABCE (5) ABDE (......)

(06) රාජ්‍ය පිළිබඳ ෆැසිස්ට්වාදී න්‍යායට ගැලපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A රාජ්‍ය ආරම්භය පිළිබඳ ප්‍රකාශ කරයි.

B රාජ්‍යයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය ගැන අදහස් දක්වයි.

C රාජ්‍ය සමස්ථ සමාජයේම කැමැත්ත වැළඳගෙන ඇත.

D ආඥාදායක සමාජ ක්‍රමය ෆැසිස්ට් වාදීන්ගේ ආදර්ශයයි.

E මිනිසා රාජ්‍යයේ සේවකයකු වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(07) සමාජය පිළිබඳව වැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A සංවිධානය වූ මිනිස් සාමාජයක සියලුම මානව සංවිධානයන්ගේ සමස්තය වේ.

B රාජ්‍යයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූවකි.

C අනිවාර්ය සාමාජිකත්වය මත ගොඩනැගී ඇත.

D දේශසීමාවන්ගෙන් බැඳී ඇත.

E රාජ්‍යයට පසු බිහි විය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(08) දේශපාලනය අධ්‍යයනය කිරීමෙන් දාර්ශනික ප්‍රවේශය සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න,

(1) යතාර්ථයෙන් ඈත් වූවකි.

(2) ගැටළු සඳහා පරමාදර්ශ විසඳුම් සොයනු ලැබේ.

(3) අභි උපගමනය මත ගොඩනැගී ඇත.

(4) ප්‍රත්‍යක්ෂ මූලික වාදය මත ගොඩනැගී ඇත.

(5) රූසෝ ඉදිරිපත් කළ පොදු කැමැත්ත ඊට නිදසුනකි. (......)

(09) සමාජ සංවිධාන සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න,

(1) නිදහස් පැවැත්ම නැත.

(2) පුද්ගලික අරමුණු නියෝජනය කරයි.

(3) ඉටු කරන්නේ සමාජ කාර්යය පමණි.

(4) තමා සාමාජිකයන් කෙරෙහි අසහාය බලයක් භුක්ති විඳී.

(5) සමාජ පැවැත්මට උපකාරී වේ. (......)

(10) බලතල බෙදීම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A ආණ්ඩුවේ බලතල බිඳීම මින් අදහස් වේ.

B සන්ධීය ආණ්ඩුක්‍රමයක බලය බෙදීම මින් කියැවේ.

C දේශපාලන හා ස්ථාවර විධායකය අතර බලය බෙදීම මින් කියැවේ.

D ඒකීය ආණ්ඩු ක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන අධිකාරයත් අතර බලය බෙදීම මින් අදහස් වේ.

E පළාත් සභා තුළ බලතල බෙදීමක් මින් කියැවේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(11) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ පාලකයින් සම්බන්ධ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න,

(1) ජනතා බලයේ භාරකරුවන් ලෙස සැලකේ.
(2) ජනතාවට වගකීමට බැඳී සිටී.
(3) ජනතාව විසින් පත්කරනු ලැබේ.
(4) තමන්ට අභිමත පරිදි පොදු දේපල පරිහරණය කිරීමේ බලය භුක්ති විඳී.
(5) ජනතා සේවයට කැප වේ. (......)

(12) ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට අන්තර්ගත නොකළ යුතු අයිතමය තොරන්න.

(1) අණ්ඩුක්‍රම ස්වභාවය හා ව්‍යුහය.
(2) රාජ්‍යයේ ඓතිහාසික පසුබිම.
(3) පුරවැසි අයිතිවාසිකම්.
(4) ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන වල කාර්යභාරය.
(5) සංශෝධන ක්‍රියා පිළිවෙත. (......)

(13) ව්‍යාවස්ථාදායකයට අයත් කාර්යය සම්බන්ධ අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A නීති සම්පාදනය.
B රාජ්‍ය මුදල් පාලනය.
C ආනාගත නායකයින් පුහුණු කිරීම.
D ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාදායක සංශෝධනය.
E නීති ක්‍රියාත්මක කිරීම.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

The National e-learning Portal for The General Education

(14) විධායකය සඳහා අදාළ කාර්යය ඇතුළත් ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

A රාජ්‍ය සේවාව පාලනය කිරීමයි.
B නියෝග හා ආඥා නිකුත් කිරීමයි.
C විදේශ සබඳතා පාලනය.
D නීති ක්‍රියාත්මක කිරීම.
E රාජ්‍ය මූල්‍ය පාලනය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(15) ඡන්ද දායක හැසිරීම කෙරෙහි බලපාන සාධක ඇතුලත් කාණ්ඩය තෝරන්න,

A දේශපාලන පක්ෂ අනන්‍යතාවය.
B පවුල් මගින් වන දේශපාලන සමාජානුයෝජනය.
C පංති අනන්‍යතාවය.
D කාලගුණික හා දේශගුණික රටාව.
E තොරතුරු සන්නිවේදනය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(16) මැතිවරණය සඳහා අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A දේශපාලන ක්‍රමයට සුජාතභාවය සැපයෙන ක්‍රමයකි.

B ජනතා නියෝජිතයින් තෝරාපත් කරන ක්‍රමයකි.

C නියෝජිත ආයතන ගොඩනැගීම සඳහා යොදාගැනෙන උපකරණයකි.

D ඡන්දදායකයින් එකිනෙකාගේ සතුරන් කරන මාධ්‍යයකි.

E ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වයට පිටුවහලක් වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(17) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික ලක්ෂණ වන්නේ,

A පෞද්ගලික අංශයේ ප්‍රමුඛත්වය.

B සීමිත ආර්ථික නිදහස.

C ආර්ථික කළමණාකරණය සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයම මැදිහත් වීම.

D ආර්ථික කටයුතු පිළිබඳව රාජ්‍යය වැඩි වගකීමක් දැරීම.

E සමාජ සුභසාධනය සඳහා යොමු වීම.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(18) ජාතිය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න,

(1) එක් ජනවර්ගයකින් හෝ කිහිපයකින් සමන්විත විය හැක.

(2) හඳුනාගන්නේ සාමාජිකයන්ගේ වර්ණය අනුවය.

(3) දේශපාලන වශයෙන් ස්වාධීන වීම.

(4) නිශ්චිත දේශ සීමාවකින් යුත් භූමියක පදිංචි මිනිසුන්ගේ එකතුව වේ.

(5) සාමුහිකත්වය අගය කරයි. (......)

(19) දේශපාලන බලය මගින් අර්ථවත් නොවන ප්‍රකාශය තෝරන්න,

(01) සමාජ බලය.

(02) සමාජයට ඉහළින් ඇති බලය.

(03) නීතිය හා සාමය පවත්වාගෙන යාමේ බලය.

(04) රාජ්‍යය ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ බලය.

(05) යහපත් සමාජයක් පවත්වාගෙන යාමේ බලය. (......)

(20) මිනිසුන් දේශපාලනයට සහභාගී වන ක්‍රමෝපායක් නොවන්නේ කුමක්ද ?

(1) ජනමත විචාරණය.

(2) මැතිවරණ.

(3) දේශපාලන විරුද්ධවාදීන්ට පහර ගැසීම.

(4) බලපෑම් කණ්ඩායම්.

(5) මහජන මතය. (......)

(21) ''රාජ්‍ය'' සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අනිවාර්ය නොවූ සාමාජිකයන්ගෙන් ගොඩනැගී ඇත.

(2) ස්වාධිපති බලය සහිත දේශපාලන ඒකකය වේ.

(3) දණ්ඩනීතිය බලය පිළිබඳ ඒකාධිකාරය භුක්ති විඳී.

(4) දණ්ඩනීතිය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳ සුජාතභාවය උරුම කරගෙන ඇත.

(5) අවශ්‍ය වූ විට සාමාජිකයින්ට ඉවත් විය නොහැක. (......)

The National e-learning Portal for The General Education

(22) ආණ්ඩුව සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සියළුම ජනතාවගේ පොදු අභිමත නියෝජනය කරයි.

(2) ප්‍රජාතන්ත්‍රවාදී හෝ නුප්‍රජාතන්ත්‍රවාදී විය හැක.

(3) එක් පුද්ගලයෙකුගෙන් හෝ පුද්ගල කණ්ඩායම් වලින් සමන්විත වේ.

(4) රාජ්‍යයෙන් වියුක්තව වුවද පැවතිය හැක.

(5) ඒකාධිපති හෝ ප්‍රජාතන්ත්‍රවාදී විය හැක. (......)

(23) ''සමාජය'' සම්බන්ධ වැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A දේශසීමාවන්ගෙන් බැඳී ඇත.

B අනිවාර්ය සාමාජිකයන් මත ගොඩනැගී ඇත.

C රාජ්‍යයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූවක් වේ.

D සංවිධානය වූ මිනිස් සමාජයක සියලුම මානව සංවිධානයන්ගේ සමස්ථය වේ.

E නිශ්චිත ජනගහනයකින් යුක්ත විය යුතුය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(24) දේශපාලන සමාජානුයෝජනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.

B මිනිසුන්ගේ දේශපාලන සමාජයට හුරුපුරුදු කරන ක්‍රියාදාමය වේ.

C මිනිසුන් දේශපාලන ප්‍රාගුණ්‍යයන් වර්ධනය කරගන්නා ක්‍රියාදාමය වේ.

D දේශපාලනයේ දූෂිත භාවිතයෙන් මිනිසුන් ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.

E දේශපාලනය දැනුවත් පුද්ගලයෙකු බිහි වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(25) ආණ්ඩුව තම බලය ජනතාව මත ක්‍රියාවට නංවන මාර්ගයක් නොවන්නේ,

(1) කැමැත්ත මත. (2) බල කිරීම මත.

(3) අල්ලස් හා දූෂණ. (4) දඬුවම් කිරීම්.

(5) පොලීසිය, බන්ධනාගාර උපයෝගී කරගනී. (......)

- **පහත සඳහන් පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා තිත් ඉරි මත ලියන්න. (අංකය)**

(26) රාජ්‍ය විකාශණය පිළිබඳ අනුපිළිවෙල වඩාත් නිවැරදිව පෙන්නුම් කරන්නේ කුමන කාණ්ඩයේද ?

(1) පවුල/සමාජය/ගෝත්‍රය/රාජ්‍යය (2) රාජ්‍යය/සමාජය/පවුල/ගෝත්‍රය

(3) සමාජය/පවුල/ගෝත්‍රය/රාජ්‍යය (4) පවුල/ගෝත්‍රය/සමාජය/රාජ්‍යය

(5) රාජ්‍යය/සමාජය/ගෝත්‍රය/පවුල (......)

පහත වගුව පදනම් කරගෙන 27 සිට 31 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වගුවේ වම් කොටසේ දක්වා ඇති එක් එක් න්‍යායට ගැලපෙන අංග ලක්ෂණ කිහිපයක් වගුවේ දකුණු කොටසේ දක්වා ඇත.

(27)

| රාජ්‍ය පිළිබඳ න්‍යායාය | අංග ලක්ෂණ |
|---|---|
| ලිබරල්<br>සමාජවාදී<br>පැසිස්ට් | A. රාජ්‍යය අසානයෙදී වියලී යන්නේය.<br>B. රාජ්‍ය වූ කලී පොදු යහපත උදෙසා ගොඩනැගූ සමාජ සංවිධානයක් වේ.<br>C. පුද්ගල නිදහස උත්තරීතර වේ.<br>D. සමානාත්මතාව පිළිබඳ අදහස පිලිනොගනී.<br>E. රාජ්‍ය පංති ආයුධයක් වේ.<br>F. පුද්ගලයන් රාජ්‍යයේ අවශ්‍යතාවට අනුව ක්‍රියාත්මක කළයුතු වේ.<br>G. රාජ්‍ය සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.<br>H. රාජ්‍යය සහ ජාතිය උත්තරීතර කොට සලකයි.<br>I. හැකියාවට අනුව හැමදෙනාගෙන්ම අවශ්‍යතාවන්ට අනුව හැමදෙනාටම. |

(28) රාජ්‍ය පිළිබඳ ලිබරල් න්‍යායට අදාළ වන්නේ කුමන ලක්ෂණ අන්තර්ගත කාණ්ඩයද ?

(1) ABC (2) DEF (3) GHA (4) GBC (......)

(29) රාජ්‍ය පිළිබඳ සමාජවාදී න්‍යායට අදාළ වන්නේ කුමණ අංග ලක්ෂණ අන්තර්ගත කාණ්ඩයද ?

(1) ABC (2) BCD (3) AEI (4) GHI (......)

(30) රාජ්‍ය පිළිබඳ පැසිස්ට් න්‍යායට අදාළ වන්නේ කුමණ අංග ලක්ෂණයද ?

(1) CHD (2) DFG (3) DFH (4) ADF (......)

(31) ලිබරල්වාදයේ මූලිකාංග නිවැරදිව දැක්වෙන ප්‍රකාශය/ප්‍රකාශ කුමක්දැයි හඳුන්වන්න.

A ලිබරල්වාදයේ නැගීම හා ධනවාදයේ වර්ධනය එකිනෙකට සම්බන්ධ වේ.

B ලිබරල්වාදය තුළ පුද්ගලයාට නිදහස හිමි වේ.

C ලිබරල්වාදය ශක්තිමත් ආණ්ඩුවකට පක්ෂපාතී වේ.

D අදහස් මාලාවක් වශයෙන් ලිබරල්වාදය කාලයත් සමග බලතල වෙනස්කම් වලට ලක් වී ඇත.

(......)

- **පහත සඳහන් පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා එයට අදාළ වාක්‍යයේ අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**

(32) පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් රාජ්‍යය පිළිබඳ මුල් කාලීන ලිබරල් න්‍යායට ඉතාම අඩුවෙන් අදාළ වන්නේ කවර ප්‍රකාශයද ?

(1) හොදම රාජ්‍යය අඩුවෙන්ම ආණ්ඩු කරන රාජ්‍යයයි.

(2) රාජ්‍යය විසින් මිනිසුන්ට ඔවුන්ගේ කාර්යයන් සංවිධානය කරගැනීමට ඉඩදිය යුතුය.

(3) රාජ්‍ය ආයෝජනය කළ යුත්තේ ක්ෂණිකව ප්‍රතිඵල සහතික කළ ව්‍යාපාර වලය.

(4) නීතිය හා සාමය ඇති කිරීම රාජ්‍යයේ වගකීමයි. (......)

(33) රාජ්‍ය පිළිබඳ සමාජවාදී න්‍යායාට අදාළ ප්‍රකාශ කාණ්ඩ හඳුන්වන්න.

A රාජ්‍ය බලය ඍජු ලෙස ආර්ථික බලය හා බැඳේ.

B කොමියුනිස්ට් සමාජයක රාජ්‍ය නිර්ධන පන්තිය අත්පත් කරගැනීම.

C සුළුතර ආර්ථික බලය දරනතාක්කල් රාජ්‍ය පැවැත්ම අවශ්‍ය වේ.

D රාජ්‍ය සුභසාධන සංවිධානයක් නොවීම.

(1) ABC (2) BCD (3) CDA (4) ABD (......)

- **1948 හා 1972 ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායකය හා අදාළ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. එම ප්‍රකාශ පදනම් කරගෙන අංක 34 හා 35 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත විය.
B අධිකරණ ප්‍රතිනිරීක්ෂණයට යටත්ව නීති පනවන ලදී.
C පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය යන මූලධර්මය පදනම් කොට ගෙන පිහිටු වීය.
D ව්‍යවස්ථාදායක බලය ජනතාව සමග බෙදා ගනී.
E විශේෂයෙන් හඳුනාගත් සුළුතරයන් සඳහා නියෝජිතයන් සහිත විය.
F ව්‍යවස්ථාවේ 29 වැනි වගන්තියෙන් දැක්වූ සීමාවන්ට යටත් විය.

(34) 1948 ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) BEF (3) ACE (4) ADF (5) ACD (......)

(35) 1972 ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකයට අදාළ නිවැරදි ප්‍රකාශ තෝරන්න.
(1) ABF (2) BDF (3) CDF (4) DEF (5) ACD (......)

(36) 1930 ගණන්වල වාමාංශික ව්‍යාපාරය
A පූර්ණ නිදහස ඉල්ලා සිටින ලදි.
B බටහිර අධ්‍යාපනය ලද බුද්ධිමතුන් කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලදි.
C අරමුණු ඉටුකර ගැනීම උදෙසා සාමකාමී ක්‍රියාමාර්ග භාවිත කළේය.
D ඉල්ලා සිටියේ ස්වයං පාලනය මිස නිදහස නොවේ. (......)

(37) සොල්බරි ව්‍යවස්ථාව ගොඩනඟන ලද ප්‍රධාන ව්‍යවස්ථානුකූල ලේඛනයන්ට අදාළ නොවන ලේඛනය කුමක්ද?
(1) 1947 ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (2) 1947 ස්වාධීනතා පනත
(3) බාහිර කටයුතු ගිවිසුම (4) ආරක්ෂක කටයුතු ගිවිසුම
(5) අභ්‍යයන්තර කටයුතු ගිවිසුම (......)

- **1948 හා 1972 ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක වූ නාමික විධායකය හා අදාළ ප්‍රකාශ කීපයක් පහත දැක්වෙන අතර එම ප්‍රකාශ පදනම් කරගෙන අංක 38 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

A පත්කරනු ලැබුයේ බ්‍රිතාන්‍ය කිරීටය විසිනි.
B පත්කරනුයේ අගමැතිවරයා විසිනි.
C පනත්වලට අවසාන අනුමැතිය දීමේ බලය හිමි වේ.
D හිමි වූයේ අඩු බලයක් හා ගරුත්වයක්ය.
E නිල කාලය නිශ්චිතව දක්වා නොතිබිණ.
F ව්‍යවස්ථාදායකයේ අනුමැතිය සහිතව අගමැතිට ඉවත් කළ හැකිය.

(38) 1948 ව්‍යවස්ථාව යටතේ පැවති නාමික විධායකයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) BDE (3) ACE (4) ADF (5) ACD (......)

- **1948 හා 1972 ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක රාජ්‍ය සේවය හා අදාල ප්‍රකාශ කීපයක් පහත දැක්වෙන අතර එම ප්‍රකාශ පදනම් කරගෙන අංක 39 හා 40 ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

A රාජ්‍ය සේවය කැබිනට් මණ්ඩලයේ ඍජු පාලනය යටතට පත්කරන ලදී.
B රජයේ සේවකයන් පිළිබඳ වගකීම රාජ්‍ය සේවා කොමිසන් සභාව නමින් හඳුන්වන ස්වාධීන කොමිසන් සභාවකට පවරා තිබේ.
C රාජ්‍ය සේවය පාලනය හා සම්බන්ධව කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකිව යුතු විය.
D රාජ්‍ය සේවය පාලනය හා සම්බන්ධව මණ්ඩල දෙකක් පත්කරයි.
E සාමාජිකයක් තිදෙනෙකුගෙන් යුත් රාජ්‍ය සේවා කොමිසමක් විය.
F රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සාපේක්ෂව ඉහල මට්ටමක පැවතුණි.

(39) 1948 ව්‍යවස්ථාව යටතේ පැවති රාජ්‍ය සේවයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) BEF (3) ACE (4) ADF (5) ACD (......)

(40) 1972 ව්‍යවස්ථාව යටතේ පැවති රාජ්‍ය සේවයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ABF (2) BDF (3) CDF (4) DEF (5) ACD (......)

- **නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ ලක්ෂණ කීපයක් පහත සඳහන් ප්‍රකාශවල අඩංගු වී ඇත. එම තොරතුරු පදනම් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A නමැති රාජ්‍යයේ ස්වාධිපති බලය ක්‍රියාවට නැංවීම සඳහා බල මධ්‍යස්ථාන හෙවත් ආණ්ඩු කිහිපයක් සහභාගී වේ.

B නමැති රාජ්‍යයේ ස්වාධිපති බලය තනි මධ්‍යම ආණ්ඩුවක් විසින් ක්‍රියාවට නැංවීම සිදු වේ.

C නමැති රාජ්‍යයේ විධායක බලය විමධ්‍යගත වූ, වගකීම් සහිත අකාර්යක්ෂම, අස්ථාවර නමුත් ප්‍රජාතන්ත්‍රවාදී භාවයෙන් වැඩි ආණ්ඩුක්‍රමයක් පවතී.

D යනු පොදු ආර්ථික සහ තාක්ෂණික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා බිහි වූ ස්වාධීන රාජ්‍ය කිහිපයක එකතුවකි.

E නමැති රාජ්‍යයේ විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයෙකු සහ අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයක් සහභාගි වන ආකාරය දැකිය හැක.

(41) E ප්‍රකාශයෙහි සඳහන් වන රාජ්‍යයෙහි පවතින ආණ්ඩුක්‍රමය ඔබ හඳුන්වන්නේ කෙසේද ?

(1) සන්ධීය ආණ්ඩුක්‍රමය (2) ඒකීය ආණ්ඩුක්‍රමය
(3) සංයුක්ත ආණ්ඩුක්‍රමය (4) මිශ්‍ර විධායක ආණ්ඩුක්‍රමය
(5) ඒක පුද්ගල තන්ත්‍රය (......)

(42) C ප්‍රකාශයෙහි සඳහන් වන රාජ්‍යයෙහි පවතින ආණ්ඩුක්‍රමය ඔබ හඳුන්වන්නේ කෙසේද ?

(1) ජනාධිපති ආණ්ඩුක්‍රමය (2) කැබිනට් ආණ්ඩුක්‍රමය
(3) සහසන්ධීය ආණ්ඩුක්‍රමය (4) මිශ්‍ර විධායකය
(5) ඒක පුද්ගල තන්ත්‍රය (......)

(43) දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය ලකුණු කරන්න.

(1) පක්ෂ පාලකයන් හා පාලිතයන් එකට සම්බන්ධ කරයි.
(2) නූතන පක්ෂවලට ස්ථිර සංවිධාන තිබේ.
(3) මැතිවරණ තුළින් පක්ෂ මහජන සහයෝගය සොයයි.
(4) සෑම පක්ෂයක්ම සාමාජිකයන් විසින් පාලනය කරනු ලබයි.
(5) කේවල පක්ෂ හා ජනතා පක්ෂ ලෙස වර්ග කළ හැක. (......)

(44) රාජ්‍ය පරිපාලනයේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය හඳුන්වන්න.

(A) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයයි. (B) සේවකයන් බඳවා ගැනීමයි.
(C) නීති සම්පාදනයයි. (D) මූල්‍ය කළමනාකරණයයි.
(E) මානව සම්පත් කළමනාකරණයයි.

(1) ABCE (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCD (......)

(45) අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු පිළිබඳව අදාළ වන ප්‍රකාශ කාණ්ඩය හඳුන්වන්න.

(A) ජාතික ආරක්ෂාව තහවුරු කරගැනීම
(B) ජාතික ආර්ථිකය ඉහළ නැංවීම
(C) ජාතික සුභසාධනය පහළ දැමීම
(D) ජාතික අභිමානය ආරක්ෂා කොට පවත්වාගෙන යාම
(E) ජාතික මතවාදය ආරක්ෂා කොට පවත්වාගෙන යාම

(1) ABCE (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCD (......)

(46) ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ සම්බන්ධයෙන් අදාළ නොවන වගන්තිය කුමක්ද

(1) ලිඛිත හා දීර්ඝ ව්‍යවස්ථාවක් පැවතීම.

(2) අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි.

(3) අනම්‍ය ව්‍යවස්ථාවක් වීම.

(4) සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වීම.

(5) බහුතර විධායකයක් පැවතීම. (......)

(47) අදාළ නොවන ප්‍රකාශය කුමක්ද ? ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකයේ බලතල හා කාර්යය වූයේ,

(1) රටේ බාහිර සුරක්ෂිතභාවය හා ස්වාධීනත්වය සහතික කරන විධිවිධාන පැනවීම.

(2) සිවිල් සේවයේ කටයුතු අධීක්ෂණය කිරීම.

(3) විදේශ රාජ්‍යයන් සමග ගිවිසුම් වලට එළඹීම අනුමත කිරීම.

(4) කම්කරු ආරවුල් විසඳීම

(5) හමුදාව පාලනය කිරීම හා යුද්ධය හෝ සාමය ප්‍රකාශ කිරීම.

(48) ආණ්ඩුව යනු

(1) රාජ්‍යයේ ක්‍රියාත්මක බව ආණ්ඩුවයි.

(2) රාජ්‍යයක් තොරව ආණ්ඩුවකට ක්‍රියාත්මක විය නොහැකියි.

(3) ආණ්ඩුව රාජ්‍ය ගොඩනැගී ඇති සංයුතික සාධක හතරෙන් එකකි.

(4) ආණ්ඩුව යනු කිසියම් දේශපාලන පක්ෂයක බලය දැරීමයි.

(5) න්‍යායාත්මකව ගත් විට ආණ්ඩුව රාජ්‍යයේ නියෝජිතයා වුවද ප්‍රායෝගිකව ගත් විට දැකිය හැකි තත්වය වන්නේ ආණ්ඩුව රාජ්‍යයේ ස්වාමියා වීමයි. (......)

(49) සමාජය යනු

(1) යම් භූමි ප්‍රදේශයක් තුළ ජීවත් වන ජනතාව විසින් තමන්ගේ ඕනෑ එපාකම් සපුරා ගැනීම සඳහා පිහිටුවාගෙන ඇති සමස්ථ සංවිධාන ජාලයේ එකතුව සමාජයයි.

(2) සමාජයේ දේශපාලන අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස රාජ්‍ය පිහිටුවා ගෙන ඇත.

(3) රාජ්‍ය මිනිසාගේ බාහිර පැවැත්මද, සමාජය මිනිසාගේ අභ්‍යයන්තර පැවැත්මද පාලනය කරයි.

(4) සමාජයේ බලයට රාජ්‍යය යටත් වන්නේ විවිධත්වය පදනම් කරගත් රාජ්‍ය අභිවෘදිය සඳහා ඉදිරියට මෙහෙය වීමේ වගකීම සමාජයට පැවරී ඇති නිසායි.

(5) සමාජය බිහි වූ පසුව රාජ්‍යය බිහි විය. (......)

(50) සමාජ සංවිධාන යනු

(1) සමාජ සංවිධානය යනු රාජ්‍ය තුළ ජීවත් වන මිනිසුන් විසින් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා සපුරාගැනීම පිණිස ගොඩනගා ඇති සංවිධානයන්ය.

(2) සමාජ සංවිධානවල ක්‍රියාකාරීත්වය තීරණය වන්නේ රාජ්‍ය විසින් ඒවාට ක්‍රියාත්මක වීමට ඉඩ දී ඇති ප්‍රමාණය අනුවය.

(3) රාජ්‍යය හා සමාන බලයක් සමාජ සංවිධාන වලට ඇත.

(4) එක් පුද්ගලයෙකුට සමාජ සංවිධාන ඕනෑම ප්‍රමාණයක සාමාජිකත්වය ලබාගත හැක.

(5) සමාජ සංවිධානවල සාමාජිකත්වය ස්වෙච්ඡාමය එකකි. (......)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- මෙම ප්‍රශ්න පත්‍රය **A** හා **B** වශයෙන් කොටස් දෙකකි.
- **A** කොටස සඳහා කෙටි පිළිතුරු සපයන්න.

---

## A කොටස

(01) දේශපාලන විද්‍යාව සමාජ විද්‍යා විෂයයක් වීමට බලපාන හේතු සාධක දෙකක් ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(02) ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ දෙකක් ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(03) රාජ්‍යය සමාජයෙන් වෙනස් වන සාධක දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(04) 'කුමාරයා' කෘතියේ සහ 'සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුති දෙකක්' කෘතියේ කතෘවරුන් දෙදෙනා නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(05) ''නව රාජ්‍ය'' යන්න පැහැදිලි කරන්න.

..........................................................................................

..........................................................................................

(06) ව්‍යවස්ථානුකූල වාදය යනු කුමක්ද ?

.............................................................................................................................................

.............................................................................................................................................

(07) සමාජවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(1) .............................................................................................................................

(2) .............................................................................................................................

(08) මිනිසුන් නීතියට යටත් වන්නේ ඇයි ? හේතු දෙකක් සඳහන් කරන්න.

(1) .............................................................................................................................

(2) .............................................................................................................................

(09) ජාතික රාජ්‍ය බිහිවීමට හේතු දෙකක් ලියන්න.

(1) .............................................................................................................................

(2) .............................................................................................................................

(10) මිනිසාගේ දේශපාලන හැසිරීම කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න.

(1) .............................................................................................................................

(2) .............................................................................................................................

(ලකුණු 10 × 2 = 20)

The National e-Learning Portal for The General Education

## B කොටස

(01) දේශපාලන විද්‍යාවේ ස්වභාවය පැහැදිලි කරන්න.

(02) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය දක්වා එය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පහදන්න.

(03) ලිබරල්වාදය හා සමාජවාදය යටතේ පහත දැක්වෙන මාතෘකා සසඳන්න.

(1) රාජ්‍යයේ ආරම්භය හා විකාශණය

(2) රාජ්‍යයේ කාර්යභාරය හා අනාගතය

(04) (අ) රාජ්‍ය හා අනෙකුත් සංවිධාන

(ආ) රාජ්‍යය හා ආණ්ඩුව පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 15 × 2 = 30)

The National e-learning Portal for The General Education